## ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - 2010

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මතය
-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31දිනට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.2.1 ශ්‍රී ලංකා උසස් ගිණුම්කරණ පරිචයන්
---------------------------------------

පහත දැක්වෙන උසස් ගිණුම්කරණ පරිචයන්ට අනුකූල නොවීම් විගණනයේ ද නිරීක්ෂණය විය.

(අ) ගොඩනැගිලි ක්ෂය සඳහා ප්‍රමාණවත් ක්ෂය ප්‍රතිශතයක් වෙන්කර නොතිබුණ අතර මෙය සරල මාර්ග ක්‍රමය අනුව වත්කමෙන් 1% ක ලෙස දක්වා තිබුණි.

(ආ) මෝටර් රථවල පිරිවැය රු. 4,955,347 ක් වූ අතර මෙය 2009 දෙසැම්බර් 31 දින වන විට අගය ශූන්‍ය වී තිබුණි. මෙම මෝටර් රථ නැවත ප්‍රත්‍යගණනය කර සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඇ) එක් එක් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කෙරෙන මූල්‍ය ප්‍රතඵල වලට පූර්ව වර්ෂ ගැලපුම් කිරීම දිගින් දිගටම පැවතුණි. 2001 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කරන ලද පසු වර්ෂ ගැලපීම් සලකා බැලීමේ දී රු.මිලියන 1.5 සිට රු. මිලියන 13 දක්වා ගැලපීම් කර තිබුනද එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් වලින් අත්හැරීම්

------------------------

(i) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වලට අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලිපිද්‍රව්‍ය තොග ශේෂය රු. 273,616 ක් වූ අතර මෙය අවසන ගිණුම් වලින් අත්හැර තිබුණ.

(ii) සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉංජිනේරු අංශය සතුව තිබූ වත්කම් රු. 3,047,000 ක් අවසාන ගිණුම්වලට ගෙන නොතිබුණි.

(iii) සිරප් අරමුදලෙන් ලැබී තිබූ පරිගණක යන්ත්‍ර 29 ක වටිනාකම ගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(iv) හිඟ විගණන ගාස්තු රු. 2,923,077 ක් වූ අතර, මෙය ගිණුම්වල දක්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මේවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) යහසාධක අරමුදලේ රු. 6,000,000 ක් ආයෝජනය කර ඇති නමුත් ආයෝජන ආදායම් රු.747,000 ක් ගිණුම්වල දක්වා නොතිබුණි.

1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ

-----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ වෙළඳ ණයගැති ශේෂය රු. 4,889,001 ක් වූ අතර, කාල විශ්ලේෂණ අනුව වර්ෂ 5 ඉක්මවා තිබූ ණයගැති ප්‍රමාණය රු. 3,596,424 ක් විය. මෙම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වෙළඳ ණයහිමි ශේෂය රු. 18,158,776 ක් වූ අතර මෙයින් වර්ෂ එක ඉක්මවූ ප්‍රමාණය රු. 7,065,433ක් වී තිබුණි.

1.2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| යොමුව | විස්තරය |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි (මු.රෙ.)** | |
| i. මු.රෙ. 133 (2) | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය සමාලෝචිත වර්ෂය තුල කිසිදු විගණන විමසුමක් නිකුත් කර නොතිබුණි. |
| ii.මු. රෙ. 371(5) | නිළධාරියෙකු ලබාගත් අත්තිකාරම් මුදල් එම වර්ෂයේම දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කර තිබිය යුතු වුවද, 2009 - 2010 වර්ෂවල ලබාගත් රු. 99,235 ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා නිරවුල් කර නොතිබුණි. |
| iii. මු . රෙ 446 | (i) මුදල් පොතේ ලැබීම් හා ගෙවීම් අනුව කාලානුක්‍රම පිළිවෙලින් එදිනෙදාට පවත්වා ගත යුතු අතර, දිනපතා තුලනය කර වගකිවයුතු අධීක්ෂණ හෝ මාණ්ඩලික නිලධාරියකු විසින් මුදල් පොතේ අත්සන් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br><br>(ii) මණ්ඩලයේ කටුබැද්ද වඩු පුහුණු ආයතනයේ 2010 ජනවාරි සිට දෙසැම්බර් දක්වා එකතුව රු. 560,925 ක් මුදල් පොතේ සටහන් කර නොතිබුණි. |
| **(ආ) චක්‍රලේඛ** | |
| (i) 1998 ජුනි 02 දිනැති අංක PE1/000/6 (Allow) Voll Temporary දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | මණ්ඩලයේ සභාපතිවරයා හැර වෙනත් කිසිදු නිලධාරියෙකුහට රාජකාරි හෝ පුද්ගලික සංග්‍රහ බිල්පත් ප්‍රතිපූර්ණය කර ගැනීමට හැකියාවක් නොතිබියදී ඊට පටහැනිව මණ්ඩලයේ කළමනාකරණ අධ්‍යක්ෂක හා විධායක අධ්‍යක්ෂක (පාලන) පිළිවෙලින් රු.38,723 ක් හා රු. 10,472 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. |

| | |
|---|---|
| (ii) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 2009 සැප්තැම්බර් 01 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ ඩීඑම්ඒ 2009/(2) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ශේෂය රු. 169,400,402 ක් වූ අතර ඒ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 6,034,558 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු. 6,947,465 ක වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු. 12,982,023කින් වර්ධනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන්ම බලපා තිබුනේ ඉංජිනේරු අංශය උපයා තිබූ රු. 15,566,727ක ශුද්ධ ආදායමයි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය සාධනය

(අ) පිළිගත් සම්මතය අනුව ජංගම අනුපාතය (ජංගම වත්කම් : ජංගම බැරකම්) 2:1 ක් වුවත් මණ්ඩලයේ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ දී 0.73 : 1ක් වී තිබූ අතර පසුගිය වර්ෂයේ 0.75 :1ක් වී තිබුණි.

(ආ) 2010 වර්ෂයේදී ලක්සල කොටුව හා අනෙකුත් ශාඛාවල ඉලක්කගත විකුණුම් 24% සිට 85 % දක්වා පරාසයක තථ්‍ය විකුණුම් අඩු වී තිබුණි.

(ඇ) 2009 වර්ෂය තුල මුළු විකුණුම් ආදායම රු. 131,320,505 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු. 224,292,147ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු විකුණුම් ආදායම රු. 92,971,642 කින් හෙවත් 71% කින් වර්ධනය වී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අපනයන ආදායම රු. 773,401 කින් හෙවත් 118% කින් වර්ධනය වී තිබුණි.

2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) උපදේශකවරයෙකු බඳවාගෙන මසකට රු. 30,000 බැගින් මාසික දීමනාවක් ගෙවා තිබුණ ද කාර්ය භාරය නියම කර නොතිබූ හෙයින් කාර්ය සාධනය තක්සේරු කළ නොහැකි විය.

(ආ) 2010 ඔක්තෝබර් 13 සිට 22 දක්වා චීනයේ පැවති කැන්ටන් වෙළඳ ප්‍රදර්ශනය සඳහා මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකු සහභාගි වී තිබූ අතර ඒ සඳහා මණ්ඩලය විසින් රු. 543,105ක මුදලක් වැයකර තිබුණ. මෙම ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීම සඳහා කිසිදු භාණ්ඩයක් රැගෙන ගොස් නොතිබූ අතර අලෙවි ප්‍රවර්ධනයක් ද සිදුවී නොතිබුණි.

(ඇ) බම්බලපිටිය ලක්සල ප්‍රදර්ශනාගාරය අලෙවි කිරීමට අදාල වැඩිම ලංසුව වන රු. 4,200,000 කට මිල තීරණය කර බාහිර පාර්ශවයකින් රු. 2,100,000 ක අත්තිකාරමක් 2009 වර්ෂයේ දී ලබාගෙන තිබුණි. මෙම ගොඩනැගිල්ලේ අයිතිය පැවරීමට හා ඉතිරි මුදල වන රු. 2,100,000 ක එම පුද්ගලයා ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ජාතික ශිල්ප සභාව වෙත පවරනු ලැබූ ශිල්පීය පුහුණු අංශයේ වත්කම් හා බැරකම් නිසි පරිදි පවරා දීම අවසන් කර නොතිබුණි.

2.2.3 ඌණ උපයෝජිත වත්කම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වසර 15 ක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගත් ආයුධ අයිතම් 14 ක් යටතේ උපකරණ 296 ක් ගබඩාවේ තැන්පත් කර තිබුණි.

(ආ) නව යන්ත්‍ර මිලදී ගැනීම නිසා තවදුරටත් පාවිච්චි කළ හැකි භාවිතයෙන් ඉවත් කළ වඩු කාර්මික යන්ත්‍ර 08 ක් වසර 05 ක පමණ කාලයක සිට ගබඩාවල තබා තිබූ අතර මේවා ප්‍රයෝජනයට ගැනීමට හෝ ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) ගාල්ල ලක්සල භූමියේ පිහිටි වර්ග අඩි 600 ක් පමණ වූ ගොඩනැගිල්ල 2009 වර්ෂයෙන් පසු භාවිතයට ගෙන නොතිබුණි.

2.2.4 හඳුනාගත් පාඩු

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ලක්සල ප්‍රධාන කාර්යාලයේ බතික් අංශයේ රු. 119,580 ක භාණ්ඩ ඌනතාවයක් විය.

(ආ) මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් නියමිත දිනට ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් රු. 1,497,331 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඈ) පළාත් පාලන බල මණ්ඩලය වෙත වාර්ෂිකව ගෙවිය යුතු වරිපනම් බදු නියමිත දිනට ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් රු. 655,640 ක් අධිභාරයක් සමාලෝචිත වර්ෂය තුල ගෙවීමට සිදුවී තිබුණි. එම මුදල් උපචිත වියදම් යටතේද ගිණුම් ගතකර නොතිබුණි.

2.2.5 අයවැය ලේඛණමය පාලනය

-----------------------------

අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර 23% සිට 349% දක්වා විචලනයක් වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන කෂෙත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් පාලනය

(ආ) අත්තිකාරම් ගෙවීම සහ නිරවුල් කිරීම

(ඇ) නිෂ්පාදන මිලදී ගැනීම, මුදල් ගෙවීම සහ අලෙවිය

(ඈ) විකුණුම්/ ආපසු ලැබීම්/ ණයට විකුණුම්/ අපනයන විකුණුම්

(ඉ) මූල්‍ය කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය.

(ඊ) අදාල නෛතික විධිවිධාන අනුගමනය කිරීම.

(උ) පොත්පත් හා ලිපිගොනු පවත්වාගෙන යාම

(ඌ) ගිණුම්කරණය